ව්‍යාපාරික කාන්තාවක් විසින් කරන ලද පැමිණිල්ලක් අනුව සැකපිට අත්අඩංගුවට ගැනුණු, ගෘහ සේවිකාවක් ලෙසින් සේවය කළ කාන්තාවක්, පොලිස් අත්අඩංගුවේ පසුවන අතරතුර අසනීප වී ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මියයැමේ සිදුවීම සහ එම සිදුවීමට අදාළ පසු සිදුවීම් සම්බන්ධයෙන් දිගින් දිගටම මාධ්‍ය වාර්තා කරනු දක්නට ලැබිණි.

මේ සම්බන්ධයෙන් වාර්තා කරන සති අග අරුණ පුවතක් අපි සලකා බලමු.

මෙම පුවතේ සිරස්තලයෙහි මිය ගිය කාන්තාව "බැලමෙහෙවර" කිරීමට ආ බව සඳහන්ව තිබිණි. එසේම, පුවත තුළ මියගිය කාන්තාව "මෙහෙකාර සේවයට" පැමිණි බවත්, පුවතට අදාළ සැකකාර ව්‍යාපාරික කාන්තාව "සුරූපිනියක" බවත් සඳහන් වේ.

ඔබ සිතන ලෙසට,

1) මෙම පුවතට අදාළ මිය ගිය කාන්තාව "මෙහෙකාරිය" ලෙසින් හැඳින්වීම සුදුසු ද? එසේ නොමැති නම් "ගෘහ සේවිකාව" වැනි යෙදුමක් භාවිතය වඩාත් යෝග්‍ය නොවන්නේ ද? අතීතයේ ඇතැම් වෘත්තියක් සම්බන්ධයෙන් තිබූ පසුගාමී ආකල්පයන් වර්තමානයේ තිබිය යුතු වඩාත් වෘත්තීය සම්බන්ධතාවයන්ට ආදේශ කිරීමක් "මෙහෙකාර සේවය" වැනි යෙදුම් වලින් සිදු නොවන්නේ ද?

2) එසේම, මෙම පුවතට අදාළ සැකකාර ව්‍යාපාරික කාන්තාව "සුරූපිනියක" බව පුවතේ සඳහන් කිරීමේ අවශ්‍යතාවය හෝ පදනම කුමක්ද?

මේ සම්බන්ධයෙන් මින් පෙර අප ඉදිරිපත් කළ පෝස්ට් මෙතැනින්:

https://web.facebook.com/.../a.23402767.../1943281946026853/

https://web.facebook.com/.../a.23402767.../1952819415073106/

https://web.facebook.com/.../a.23402767.../1943281946026853/